## මහ සභා වාර්තාව - වැලිමඩ ප්‍රාදේශීය සභාව

**2023 ජනවාරි 23 - වේලාව- පෙ.ව 10.30**

මෙදින පෙ.ව 10.25 ට මුලාසනය දැරූ ගරු සභාපතිතුමාවිසින් පැමිණ සිටි ගරු උප සභාපතිතුමිය ගරු මන්ත්‍රීමණ්ඩලය, සභාලේකම්තුමා කාර්ය මණ්ඩලය,මධ්‍යවේදී මහතුන් ඇතුළු සියළු දෙනාපිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**පැමිණීම**

| අනු අංකය | තනතුර | මන්ත්‍රීවරයාගේනම | පැමිණි වේලාව |
|---|---|---|---|
| 1 | ගරු සභාපති | එස්.ඒ.ආර්.බන්දුසේනමන්ත්‍රීතුමා | 10.25 |
| 2 | ගරු උප සභාපති | සීතාසමරවීර මන්ත්‍රීනිය | 10.00 |
| 3 | ගරුමන්ත්‍රීනි | එස්.ඒ.ආර්.ඥානවතී මන්ත්‍රීනිය | 10.00 |
| 4 | ගරුමන්ත්‍රී | ජේ.එම්.ඉන්දික සම්පත් මන්ත්‍රීතුමා | 9.50 |
| 5 | ගරුමන්ත්‍රී | එම්.එම්.සුජිත් කුමාර මන්ත්‍රීතුමා | 9.50 |
| 6 | ගරුමන්ත්‍රී | වජිරදෙනගම අතපත්තු මන්ත්‍රීතුමා | 9.50 |
| 7 | ගරුමන්ත්‍රී | ආර්.ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.බී.මිරහවත්ත මන්ත්‍රීතුමා | 10.00 |
| 8 | ගරුමන්ත්‍රී | ඒ.ඒ.මහම්මදු ඉල්ලියාස් මන්ත්‍රීතුමා | 10.00 |
| 9 | ගරුමන්ත්‍රී | ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමා | 9.30 |
| 10 | ගරුමන්ත්‍රී | එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මන්ත්‍රීතුමා | 10.00 |
| 11 | ගරුමන්ත්‍රී | අබ්දුල් කරීම් අබ්දුල් මුත්තලිප් මන්ත්‍රීතුමා | 10.00 |
| 12 | ගරුමන්ත්‍රී | මොහොමඩ් අලීම් මොහොමඩ් ෆායිස් සයිබුමන්ත්‍රීතුමා | 10.00 |
| 13 | ගරුමන්ත්‍රී | බී.ආර්.පද්මසිරි කුමාර මන්ත්‍රීතුමා | 10.00 |
| 14 | ගරුමන්ත්‍රී | වසන්ත නානායක්කාර මන්ත්‍රීතුමා | 9.30 |
| 15 | ගරුමන්ත්‍රී | ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මන්ත්‍රීතුමා | 9.50 |
| 16 | ගරුමන්ත්‍රී | ඩබ්.එම්.ගාමිණී ජයන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා | 10.00 |
| 17 | ගරුමන්ත්‍රී | එම්.එම්.නාලක මනතුංග බණ්ඩාර මන්ත්‍රීතුමා | 10.00 |
| 18 | ගරුමන්ත්‍රී | වී.රාසලිංගම් මන්ත්‍රීතුමා | 10.00 |
| 19 | ගරුමන්ත්‍රීනි | ඩබ්.එන්.ඩබ්.දුලාංජනී ප්‍රියදර්ශිකාමන්ත්‍රීනිය | 10.10 |
| 20 | ගරුමන්ත්‍රී | ඩී.එම්.ජයසිංහ මන්ත්‍රීතුමා | 10.10 |
| 21 | ගරුමන්ත්‍රී | ඩබ්.ඩී.කුලරත්න මන්ත්‍රීතුමා | 10.30 |
| 22 | ගරුමන්ත්‍රී | එච්.එම්.නිල්මිණී ස්වර්ණමාලිමන්ත්‍රීණිය | 9.45 |
| 23 | ගරුමන්ත්‍රී | ඩබ්.එම්.තිස්ස නාලක විජේසූරිය මන්ත්‍රීතුමා | 9.45 |
| 24 | ගරුමන්ත්‍රී | ආර්.එම්.අමරසේන මන්ත්‍රීතුමා | 9.30 |
| 25 | ගරුමන්ත්‍රී | ඒ.ඩබ්.ආර්.එම්.සාන්ත අමරකෝන් මන්ත්‍රීතුමා | 10.00 |
| 26 | ගරුමන්ත්‍රී | ජේ.එල්.රංජිත් මන්ත්‍රීතුමා | 9.30 |
| 27 | ගරුමන්ත්‍රී | ඒ.සී.එම්.මහරුෆ් මන්ත්‍රීතුමා | 9.20 |
| 28 | ගරුමන්ත්‍රීනි | ජේ.පී.එස්.චන්ද්‍රකාන්ති මැණිකේ විමලසේන මන්ත්‍රීනිය | 9.30 |
| 29 | ගරුමන්ත්‍රී | ආර්.බී.ජයතිලක මන්ත්‍රීතුමා | 9.20 |
| 30 | ගරුමන්ත්‍රීනි | ඩබ්.ඩබ්.නිමාලි නිරංජලාමන්ත්‍රීනිය | 10.00 |
| 31 | ගරුමන්ත්‍රී | එම්.එම්.දයාරත්න මන්ත්‍රීතුමා | 11.00 |
| 32 | ගරුමන්ත්‍රී | එච්.එම්.නාලක ප්‍රියන්ත කුමාර මන්ත්‍රීතුමා | 9.30 |
| 33 | ගරුමන්ත්‍රීනි | බී.ඩී.සුනේත්‍රාමන්ත්‍රීනිය | 10.00 |
| 34 | ගරුමන්ත්‍රී | තමෛද්‍රම් මහේන්ද්‍ර කුමාර් මන්ත්‍රීතුමා | 10.30 |
| 35 | ගරුමන්ත්‍රී | එල්.ඒ.ප්‍රියන්ත චමින්ද මන්ත්‍රීතුමා | 9.30 |
| 36 | ගරුමන්ත්‍රී | එච්.එම්.කරුණාරත්න බණ්ඩාර මන්ත්‍රීතුමා | 10.00 |
| 37 | ගරුමන්ත්‍රීනි | ටී.එම්.චන්ද්‍රිකාතෙන්නකෝන් මන්ත්‍රීනිය | 10.15 |
| 38 | ගරුමන්ත්‍රීනි | ඩී.පී.චන්ද්‍රිකාමන්ත්‍රීනිය | 9.30 |
| 39 | ගරුමන්ත්‍රී | එච්.එම්.කරුණාරත්නමන්ත්‍රීතුමා | 9.45 |
| 40 | ගරුමන්ත්‍රීනි | එච්.වී.එන්.කුසුම් කුමාරි මන්ත්‍රීනිය | 10.10 |
| 41 | ගරුමන්ත්‍රී | ඩී.එම්.අජිත් කුමාර මන්ත්‍රීතුමා | 10.20 |

**01- <u>2022.12.27 දින මහ සභාවාර්තාව</u>**

2022.12.7 දිනැති සභාවාර්තාවේ 4 වෙනි පිටුවේ 3 වෙනි යෝජනාව වන කමිටු පත් කිරීමට අදාළ යෝජනාවේ සමගි ජන බල වේගය ලෙස සඳහන් කර ඇති අතර එය එක්සත් ජාතික පක්ෂය ලෙසත්, 2022 කමිටුව ලෙස නම් කර ඇති කමිටුව 2023 ලෙස සංශෝධනය විය යුතු බවත්, මෙම සංශෝධනයට යටත්ව සභාවාර්තාව ස්ථිර කර ගන්නා ලෙසත් ගරු සභාපතිතුමා විසින් පවසන ලදී. ගරු මන්ත්‍රී ආර්.බී.ජයතිලක මන්ත්‍රීතුමා පවසාසිටියේ කමිටු පත් කිරීමට අදාළ යෝජනාවේ මුදල් කමිටුවට අදාළව තමාගේ නම සටහන් වී ඇති බවත්, ඒ සඳහා ගරු මන්ත්‍රී ඩී.පී. ජයතිලක මන්ත්‍රීතුමා ලෙස සංශෝධනය විය යුතු බවත්ය.ගරු මන්ත්‍රී සම්පත් ජයසුන්දර මන්ත්‍රීතුමා පවසාසිටියේ සභාවාර්තාවේ කමිටු පත් කිරීමට අදාළ යෝජනාවේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලබන සභාතීරණයේ , ''මුදල් කමිටුව සඳහා ඇති බලය නිර්දේශය ලෙසත්, ගරු සභාපතිතුමාට සභාඅරමුදලින් වියදම් දැරීමට ඇති බලය රු.250000/-ක් බවත්, ටෙන්ඩර් කමිටුව සඳහා මුදල් කමිටුවේ සාමාජිකයන් පත් කිරීමටත්, තීරණය කරන ලදී. එම තීරණය සඳහා ගරු මූලාසනය විසින් සභාවේ එකගතාවය විමසාසිටි අතර සභාවේ සියළු සභිකයින් මේ සඳහා එකගතාවය පලකරන ලදි. ඒ අනුව මෙම යෝජනාව 2022.12.27 දින මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය. "'ලෙස සඳහන් කර ඇති බවත්, එවැනි සාකච්ඡාවක් එදින සිදු නොවූ බවත්, එම නිසා එය සංශෝධනය කරන ලෙසත්,මුදල් කමිටු වාර්තාවේ සමිති මගින් ඉදිරිපත් කර ඇති යෝජනා ක්‍රියාත්මක නොකරන ලෙසත්, ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගේ නිර්දේශය මත ඉදිරිපත් කරණු ලබන සංවර්ධන යෝජනා පමණක් ක්‍රියාත්මක කරන ලෙසත්, සංශෝධන ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව එම සංශෝධනයන්ට යටත්ව 2022.11.28 දිනැති මහ සභාවාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු මන්ත්‍රී ආර්.බී.ජයතිලක මන්ත්‍රීතුමා විසින් යෝජනා කරන ලද අතර, ගරු මන්ත්‍රී වජිර දෙනගම මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදි. ඒ අනුව 2022.10.17 දිනැති මහ සභාවාර්තාව 2023.01.23 දිනැති මහ සභාවේදී සංශෝධනයන්ට යටත්ව සභාසම්මත විය.

**02- ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදන** -

**03- සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන** - නැත

**04- යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න** - නැත

**05- යථාපරිදි කල්දී ඇති යෝජනා-**

1. **<u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලබන ගුරුතලාව , හපුරෙළ යන ස්ථානයේ ඉදිකර ඇති සෝහොනකාමරය සභාවට පවරාගැනීම සම්බන්ධ යෝජනාව</u>**

උක්ත කරුන සම්බන්ධයෙන් අයි.එස්. අබ්දුල් සලාම් මයා විසින් ගුරුතලාව හපුරෙළ යන ස්ථානයේ ඔහු විසින් ඉදිකර ඇති සෝහොනකාමරය මෙම සභාවට පවරාගන්නා ලෙස ඉල්ලීම් කර ඇත. ඒ අනුව එම සෝහොනකාමරය මෙම සභාව වෙත පවරාගැනීම හා ඉදිරි කටයුතු සඳහා මහ සභාව වෙත ඉදිරිපත් කරමි.

**ස්ථිර කිරීම - ගරු මන්ත්‍රී මහරූෆ් මන්ත්‍රීතුමා**

**<u>ගරු සභාපතිතුමා</u>**

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලබු ගුරුතලාව , හපුරෙළ යන ස්තානයේ ඉදිකර ඇති සෝහොනකාමරය සභාවට පවරාගැනීම සම්බන්ධ යෝජනාව සභාඅනුමතිය ලබාගැනීම පිණිස ගරු මූලාසනය විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.එහිදී ගරු සභාව විසින් මේ සම්බන්ධව සාකච්ඡා කිරීමෙන් අනතුරුව ඉහත නම් කරන ලද සෝහොනකාමරය සභාවට පවරාගැනීමට තීරණය කරන ලදී. එම තීරණය සඳහා ගරු මූලාසනය විසින් සභාවේ එකගතාවය විමසාසිටි අතර සභාවේ සියළු සභිකයින් එකගතාවය පලකරන ලදි. ඒ අනුව එම යෝජනාව 2023.01.23 දින මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**<u>02 ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලබන 2023 වර්ෂය සඳහා ඉන්ධන ලබාගැනීම වෙණුවෙන් සී/ස වලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලබාදෙන ඇප තැන්පත් මුදල රු.6000,000.00 සිට රු.1,000,000.00 දක්වා වැඩිකිරීම සම්බන්ධයෙන් අනුමතිය ලබාගැනීම සඳහා වන යෝජනාව.</u>**

මෙම ප්‍රාදේශීය සභාවේ වාහන සඳහා ඉන්ධන ලබාගැනීම වෙණුවෙන් සී/ස වලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත මෙතෙක් තබන ලද ඇප තැන්පත් මුදල වන රු.600000.00ක මුදල රු.1,00,000.00 දක්වා වැඩි කිරීමට එම ආයතනය තීරනය කර ඇති බව 2023.01.12 දිනැති ලිපිය මගින් මෙම සභාව වෙත දන්වා ඇත.

02.ඒ අනුව එම තැන්පත් මුදල රු.1,000,000.00 දක්වා ඉහල දැමීම වෙණුවෙන් මහ සභාවේ අනුමතිය ලබාගැනීම සුදුසු බව යෝජනා කරමි.

**ස්ථිර කිරීම - ගරු මන්ත්‍රී රාසලිංගම් මන්ත්‍රීතුමා**

**<u>ගරු සභාපතිතුමා</u>**

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලබු 2023 වර්ෂය සඳහා ඉන්ධන ලබාගැනීම වෙණුවෙන් සී/ස වලිමඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ලබාදෙන ඇප තැන්පත් මුදල රු.6000,000.00 සිට රු.1,000,000.00 දක්වා වැඩිකිරීම සම්බන්ධ යෝජනාව සභා අනුමතිය ලබාගැනීම පිණිස ගරු මූලාසනය විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.එහිදී ගරු සභාව විසින් මේ සම්බන්ධව සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම තැන්පත් මුදල රු.1,000,000.00 දක්වා ඉහල දැමීම තීරණය කරන ලදී. එම තීරණය සඳහා ගරු මූලාසනය විසින් සභාවේ එකගතාවය විමසාසිටි අතර සභාවේ සියළු සභිකයින් එකගතාවය පලකරන ලදි. ඒ අනුව එම යෝජනාව 2023.01.23 දින මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

**03**

**01. <u>ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරණු ලබන 2023.01.09 මුදල් කමිටුවට ඉදිරිපත් කළ ලිපි සඳහා අනුමතිය ලබාගැනීම සම්බන්ධ යෝජනාව.</u>**

1. පුහුල්පොළ නාරංගොඩඇල්ල මාර්ගය නිසි අයුරින් පවත්වාගෙන යාම සඳහා දැන්වීම් පුවරුවක් ඉල්ලුම් කිරීම සම්බන්ධව පුහුල්පොළ එක්සත් සුභ සාධක සමිතියේ සභාපති විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

පුහුල්පොළ නන්තංගොඩ ඇල්ල මාර්ගය සඳහා පහත සඳහන් කරුණු අඩංගු දැන්වීම් පුවරුවක් මාර්ගය ආරම්භයේ ප්‍රදර්ශනය කර දෙන මෙන් ඉල්ලමින් පුහුල්පොළ එක්සත් සුභ සාධක සමිතියේ සභාපති විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී. ඒ අනුව

- මාර්ගය අවහිර වන සේ වාහන නතර කර තැබීම
- කළි කසල මාර්ගයට ගෙනවිත් දැමීම
- බර වාහන මාර්ගයට දැමීම

යන නීති විරෝධී ක්‍රියාවලක්වා ගැනීම සඳහා දැන්වීම් පුවරුවක් සකස් කර සවි කිරීමට කාර්මික නිලධාරී ඇස්තමේන්තුවක් ලබාගෙන ඒම නිර්දේශ අනුව සිදු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී වසන්ත නානායක්කාර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දින පැවති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

2. දඹවින්න උප කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා වන බිල්පත

දඹවින්න උප කාර්යාලයේ ඡායා පිටපත් යන්ත්‍රය සේවා කිරීම සඳහා වන රු.19895.00 ක බිල්පත ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් පුද්ගලික සමාගම වෙත ගෙවීම් කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දින පැවති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

3. තැන්නෙකුඹුර උප කාර්යාලයේ කාර්යාල මේස සඳහා ඉටිරෙදි ලබාගැනීම සම්බන්ධව කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

තැන්නෙකුඹුර උප කාර්යාලයේ කාර්යාල මේසවල ඇති මේසරෙදි හා ඉටිරෙදි අපවිත්‍ර වී ඇති බැවින් ඉටිරෙදි යාර 15ක් පමණ අවශ්‍ය බවත්, ඒ සඳහා රු.5300.00 ක් පමණ වැය වන බැවින් ඒවා මිලදී ගැනීමට අවශ්‍ය අනුමතිය හා මුදල් ලබාදෙන ලෙස ඉල්ලමින් කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.

ඒ අනුව උප කාර්යාල සඳහා සුලු මුදල් වශයෙන් රු.5000.00 ක මුදලක් ලබාදෙන බැවින් රු.5000.00ක මුදලට වඩා අඩු මුදලකට කාර්යාල මේස සඳහා ඉටිරෙදි දැමීම සිදු කර ගැනීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී නාලක ප්‍රියන්ත මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දින පැවති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

4. ජංගම රථයක් මගින් කඩල විකිණීම සඳහා අවසර ලබාදෙන ලෙස ඉල්ලමින් මහේන්ද්‍ර විජය කුමාර් මහතා ඉදිරිපත් කර ඇති ලිපිය

වලිමඩ නගරය ආසන්නයේ ජංගම රථයක් මගින් කඩල විකිණීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවසර ඉල්ලා අංක 13 , මොරගොල්ලවත්ත ලිපිනය සඳහන් මහේන්ද්‍ර විජය කුමාර් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.

ඒ අනුව වලිමඩ නගරයේ පදික වේදිකාව අසලින් කිසි විටෙකත් ජංගම රථය නවතා නොතැබීමට නොහැකි බවට කොන්දේසියක් පැනවීමටත්, සෑම දිනකම ප.ව.6.00න් පසු වෙළඳාමේ නියුතු වීම සඳහා අවසර දීමටත් ඒ සඳහා දිනකට රු.200.00 බැගින් අය කිරීමටත් මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී වී.රාසලිංගම් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දින පැවති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

5. වලිමඩ නව වෙළඳ සංකීර්ණයේ පවතින කඩ වලට අදාළ වෙළඳ ව්‍යාපාරික දැන්වීම් පුවරු නැවත සවි කිරීමට ඉල්ලීම සම්බන්ධව ළහිරු කිරණ වෙළඳ සංගමය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

වලිමඩ නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර, මාර්ගය ඉදිරිපසට නොපිහිටීම හේතුවෙන් වෙළඳ ව්‍යාපාරික දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කිරීම පාරිභෝගිකයන්ට කඩ පිළිබඳ දැනුවත් වීමට ප්‍රධානම රුකුලක් වන අතර, නාම පුවරු ගලවා දැමීම නිසා ව්‍යාපාර හිමියන්ගේ ආර්ථික මට්ටම කඩාවැටී ඇති බැවින් මේ සම්බන්ධව අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙස ඉල්ලමින් ළහිරු කිරණ වෙළඳ සංගමය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.

ඒ අනුව කඩ කාමරයේ ප්‍රමාණය අනුව එක සමාන දැන්වීම් පුවරු සවි කිරීම සුදුසු බවට මුදල් කමිටුව සාකච්ඡා කල අතර, ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබාගෙන මහ සභාවට යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ප්‍රභාත් ගුණතිලක මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දින පැවති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

6. නිල ඇඳුම් සම්බන්ධව නිමල් නන්දසේන මහතා ඉදිරිපත් කර ඇති ලිපිය

කැප්පෙටිපොළ නගරයේ රථ වාහන නවතා තැබීමේ ගාස්තු අය කරන නිමල් නන්දසේන මහතා දැනට වසර තුනකට පෙර ලබාදී ඇති නිල ඇඳුම් මේ වන විට පාවිච්චි කිරීමට අපහසු බැවින් නව නිල ඇඳුමක් ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.

ඒ අනුව නිමල් නන්දසේන මහතාහට රථ වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීම සඳහා නිල ඇඳුමක් ප්‍රාදේශීය සභාව මගින් ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කනර ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී වජිර දෙනගම මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දින පැවති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

7. අංක 59 ගව මස් කඩය සම්බන්ධව අයි.එස්.එම්.යෙහියා මයා ඉදිරිපත් කර ඇති ලිපිය

වලිමඩ නව වෙළඳ සංකීර්ණයේ අංක 59 ගවමස් කඩය 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද ලංසු මුදලට ලබාදෙන ලෙස ඉල්ලමින් අයි.එස්.එම්.යෙහියා මයා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.

මෙම කඩ කාමරය ටෙන්ඩර් මගින් ලබාදීම සඳහා තෙවරක් ටෙන්ඩර් කලද, ඒ සඳහා අයදුම්පත් කිසිවක් ඉදිරිපත් නොවූ බවත්, දැනට මෙම කඩ කාමරය වසා ඇති බව නිරීක්ෂණය වූ බව ආදායම් පරීක්ෂක නිලධාරී මහතා විසින්ද වාර්තා කර ඇත. එසේ ටෙන්ඩර්කරුවකු මෙතෙක් ඉදිරිපත් නොවූ බැවින් අයි.එස්.එම්.යෙහියා මයාගේ ඉල්ලීම පරිදි වලිමඩ නව වෙළඳ සංකීර්ණයේ අංක 59 ගවමස් කඩය 2023 වර්ෂය සඳහා ලබාදුන් අවම ලංසු මුදල මත ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී මුත්තලිප් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දින පැවති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

8. වලිමඩ සතිපොළ භූමියේ ඇති ආපන ශාලාව සම්බන්ධව සඳරුවන් මහතා ඉදිරිපත් කර ඇති ලිපිය

වලිමඩ සතිපොළ භූමියේ ඇති ආපන ශාලාව පවත්වාගෙන යාමට නොහැකි බැවින් 2022.11.18 දින සිට වසා ඇති බවත්, එය බාර දීමටකටයුතු කරන අතර තැම්පත් මුදල රු.25000.00 නැවත ලබාදෙන ලෙස ඉල්ලමින් සඳරුවන් මහතාඉදිරිපත්කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

මෙම සතිපොළ ආපන ශාලාව සඳහා සඳරුවන් මහතාගෙන් 2022.12.31 දිනට අය විය යුතු ගාස්තු සියල්ල අය කර ඇති බව පරීක්ෂාකර, හිඟ මුදලක් ඇත්නම් රු.25000.00 තැන්පතු මුදලින් අය කර ඉතිරි මුදල ගෙවීම් කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී වසන්ත නානායක්කාර මන්ත්‍රීතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

9. 2022.12.28 දින බෙරලන්ද නගරයේ වෙළඳ සංගමය හාපැවති සාකච්ඡාව සම්බන්ධව බෙරලන්ද උප කාර්යාලයේ කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත්කර ඇති ලිපිය

බෙරලන්ද නගරයේ ආරක්ෂිත වළක් ඉදි කිරීම සම්බන්ධව සාකච්ඡාවක් පැවති බවත්, එහිදී කාර්මික නිලධාරී පතුම් මහතා විසින් ආරක්ෂිත වළ ඉදි කිරීමේ සැලැස්ම සමබන්ධව පැහැදිලි කිරීමක් කල අතර, ආරක්ෂිත වළ ඉදි කිරීම සම්බන්ධව ත්‍රී රෝද රථ සංගමය දැඩි ලෙස විරෝධය ප්‍රකාශ කල බවත්, ආරක්ෂිත වළ ඉදි කිරීමට වඩා නගරයේ කාණු පද්ධතිය සකසීම, පදික වේදිකාව සකසීම, වැසිකිලිය අලුත්වැඩියාකිරීම ආදීයට ප්‍රමුඛතාවය ලබාදිය යුතු බවත් පැවසූ අතර, නැවත වරක් වෙළඳ සංගමයේ සභාපතිතුමාපැහැදිලි කිරීමක් කල නමුත් වෙළඳ සංගමය හාත්‍රී රෝද රථ සංගමය විරෝධය දැක්වූ බවත් විරෝධය ප්‍රකාශ කරමින් අත්සන් 32ක් සහිතව ඉදිරිපත් කර ඇති ලිපියද ඉදිරිපත් කරමින් කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව බෙරලන්ද නගරයේ පදික වළ ඉදි කිරීමට වෙළඳ සංගමය හාත්‍රී රෝද රථ සංගමය විරෝධය පල කරන බැවින්, කළුපෙටිපොළ නගරයේ පදික වළ ඉදි කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මන්ත්‍රීතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

10. වේදිකාව ගොඩනැගිල්ලේ තෙවන මහල දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගැනීම සඳහා පී.ඩබ්.රංජිත් ධර්මකීර්ති මහතා ඉදිරිපත් කර ඇති ලිපිය

වේදිකාව ගොඩනැගිල්ලේ තුන්වන මහල දීර්ඝකාලීන බදු පදනම මත ලබාදෙන ලෙසත්, එය වැඩ අවසන් කර නොමැති බැවින් තම වියදමින් සකස් කර ගැනීමට එකඟවන අතර, ඒ සඳහාවන ඇස්තමේන්තු වියදම සභාව වෙත දන්වන බවත්, ඒ සඳහාවිශාල වියදමක් දැරීමට සිදු වන බැවින් මෙම තුනවන මහල සඳහාරු.5000.00 ක මාසික කුලී පදනම මත දීර්ඝකාලීන බදු පදනම මත ලබාදෙන ලෙස ඉල්ලමින් පී.ඩබ්.රංජිත් ධර්මකීර්ති මහතාඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව වලිමඩ වේදිකාව ගොඩනැගිල්ලේ දෙවන මහලද බදු පදනම මත රංජිත් ධර්මකීර්ති මහතාලබාගෙන ඇති බැවින් ඔහුගේ ඉල්ලීම පරිදි තුන්වන මහලද පී.ඩබ්.රංජිත් ධර්මකීර්ති මහතාගේ වියදමින් සකස් කිරීමට අවසර දීමටත්, සභාවේ කාර්මික නිලධාරී මහතාගේ සැලසුමකට අනුව එය සකස් කිරීමටත්, එම ගොඩනැගිල්ලේ තුන්වන මහලට පමණක් සීමා වන පරිදි ලබාදීමටත් යන කොන්දේසි මත තැන්පතු මුදල් ලෙස රු.1500000.00 (රුලක්ෂ පහළොවක්) අය කර මාසිකව රු.10000.00 ක කුලී මුදලක් අය කර ලබා දීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී වසන්ත නානායක්කාර මන්ත්‍රීතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

11. එළවළු කඩයක් පවත්වාගෙන යාමට අනුමතිය ලබාගැනීමට ඒ.එම්.ෆාසික් මහතාඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධව ගරු සභාපතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය

එළවළු කඩයක් පවත්වාගෙන යාමට අනුමතිය ලබාගැනීම සම්බන්ධව ඒ.එම්.ෆාසික් මහතාඉදිරිපත් කරන ලද ලිපිය 2022.11.15 දින මුදල් කමිටුවට ඉදිරිපත් කල අතර, එහිදි ප්‍රදේශයේ ජනතාවගේ හාපූජනීය ස්ථාන වලින් එළවළුකඩයක් පවත්වාගෙන යාම සම්බන්දව විමසාඉදිරි කටයුතු සිදු කරන ලෙස මහ සභාඅනුමතිය ලැබී ඇති බවත්, ඒ අනුව එළවළු කඩයක් පවත්වාගෙන යාමට කැමැත්ත ප්‍රකාශ කරමින් ලබාදී ඇති ලිපි කමිටුවට ඉදිරිපත් කරන බව පවසමින් ගරු සභාපතිතුමාඉදිරිපත්කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව ආදායම් පරීක්ෂක නිලධාරී විසින් එළවළු කඩයක් පවත්වාගෙන යාමට අනුමතිය ලබාගන්නාස්ථානය පරීක්ෂා කර ආදායම් පරීක්ෂක වාර්තාවක් හාපරිසර විෂය නිලධාරීගේ පරිසර වාර්තාවක් සමඟ මහ සභාවේ අනුමතියට යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී ඉල්ලියාස් මන්ත්‍රීතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

12. සොළාවිදුලි පහන් ලබාගැනීම සඳහාඉදිරිපත් කර ඇති ලිපි

| විදුලි පහන් අවශ්‍ය ස්ථානය | ඉල්ලාඇති අය | නිර්දේශය |
|---|---|---|
| • බෙරලන්ද නගරයේ ධර්මපාල විදුහල හා රෝහලට යන මාර්ගයට යාබදව<br>• හින්නාරංගොල්ල පන්සල අසල පිටපොළ පාරට යාබදව<br>• හින්නාරංගොල්ල හන්දියේ පොලිස් විදුහලට යන මාර්ගයට යාබද පාරේ වම් පසට | ගරු මන්ත්‍රී ආර්.බී.ජයතිලක මන්ත්‍රීතුමා | ප්‍රාදේශීය සභාව සඳහා ලබාගැනීමට යෝජනාවී ඇති සූර්ය කෝෂ 125 ලබා ගැනීමේදී, මෙම ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සුදුසු බව මුදල් කමිටුව නිර්දේශ කරන ලදී |
| කළුපෙටිපොළ වැලිල්ලවත්ත මාර්ගයට | එක්සත් නාගෙනහිරු මරණාධාර සමිතිය, කළුපෙටිපොළ | |
| රේන්දපොළ ශ්‍රී ගණපති හින්දු විදුහලේ පිවිසුම් මාර්ගයට | ශ්‍රී ගණපති හින්දු විදුහලේ විදුහල්පතිතුමා | . |

| | | |
|---|---|---|
| • විදුරුපොල බෝගහ අසල මාර්ගය<br>• බලුංගල ප්‍රජාශාලාව අසල මාර්ගය<br>• ගවරම්මාන නිශ්ශංක විදුහල අසල මාර්ගය | ගරු මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා | |
| • බෝක්කේඇල්ල පෙරහැර ගබඩාව අසලට<br>• රත්කරව්ව ප්‍රජාජල ව්‍යාපෘතිය අසලට<br>• විහාරස්ථානයට පිවිසෙන මංසන්ධියට | ගරු මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා | |
| • බෝවත්ත නව නිවාස හංදිය<br>• ඉදල්ගස්හින්න කෝවිල අසල හන්දිය<br>• ඉදල්ගස්හින්න ක්‍රිස්තියානි දේවස්ථාන හන්දිය | ගරු මන්ත්‍රී ටී.මහේන්ද්‍ර කුමාර් මහතා | |
| • නිකල්ෆීල්ඩ් හන්දිය<br>• ගුරුතලාව මහ පල්ලිය අසල මාර්ගය<br>• ගුරුතලාව 6 කණුව හන්දිය | ගරු මන්ත්‍රී ඒ.සී.එම්.මහරුෆ් මැතිතුමා | |
| • වියලකුඹුර කුඩාකුසුම් පෙර පාසල අසල ක්‍රීඩාපිටිය අසලට<br>• මොදෙවීට නුගදණ්ඩ හන්දියට<br>• උඩුබද්දාන විහාරස්ථානය අසල හන්දියට | ගරු මන්ත්‍රීනී නිල්මිණී ස්වර්ණමාලි මැතිණිය | |
| • අත්කම් නිවාස හාවැලි.ල්ලවත්ත ගම් දෙක සඳහා | එක්සත් නැගෙනහිරු මරණාධාර සමිතිය, කප්පෙටිපොල | |
| • වලිමඩගම ගුනානන්ද මාවත ආරම්භ කරන ස්ථානය<br>• කින්නරකඳුර කිරිපට්ටිය නිවාස මධ්‍යයේ<br>• සප්පුකඩේ හන්දිය වලිමඩගම මාර්ගය ආරම්භ වන සප්පුකඩේ ත්‍රීවීල් රථගාල අසල | ගරු මන්ත්‍රී වසන්ත නානායක්කාර මැතිතුමා | ප්‍රාදේශීය සභාව සඳහා ලබා ගැනීමට යෝජනාවී ඇති සූර්ය කෝෂ 125 ලබා ගැනීමේදී, මෙම ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සුදුසු බව මුදල් කමිටුව නිර්දේශ කරන ලදි. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී වසන්ත නානායක්කාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය. |
| • දඹවින්න පුරාණ විහාරස්තානය අසල<br>• මුතුවැල්ලගෙඩ මංසන්ධිය අසල<br>• දිවිතොටවෙල වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය අසල | ගරු මන්ත්‍රී ගාමිණී ජයන්ත බණ්ඩාර මැතිතුමා | |
| • ගල්ඒදණ්ඩ ශ්‍රී විජිතාරාමය අසලට<br>• උඩලකුඹුර පුබුදු ක්‍රීඩාපිටිය අසලට<br>• හිඟුරුගමුව සමූපකාරය හා ග්‍රාමීය බැංකුව අසලට | ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මැතිතුමා | |
| • කරගහපතන මාර්ගයේ එන්.එම්.නවරත්න කඩේ ඉදිරිපස<br>• කරගහපතන මාර්ගයේ තුන්මං හන්දිය ඉදිරිපස<br>• නාවෙල පන්සල මාර්ගයේ දේවාලය ඉදිරිපස | ගරු මන්ත්‍රී නාලක ප්‍රියන්ත මැතිතුමා | |
| • හිඟුරුගමුව පාසල අසල මන්සන්ධියට<br>• ගම්බද්ද ජිනානන්දාරාම විහාරස්ථානය<br>• ගම්බද්ද පාසල අසල පුරන්වෙල මන්සන්ධිය | ගරු මන්ත්‍රීනී ඩී.පී.චන්ද්‍රිකා මැතිනිය | ප්‍රාදේශීය සභාව සඳහා ලබා ගැනීමට යෝජනාවී ඇති සූර්ය කෝෂ 125 ලබා ගැනීමේදී, මෙම ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සුදුසු බව මුදල් කමිටුව නිර්දේශ කරන ලදි. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට |

| | | |
|---|---|---|
| | | යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී රාසලිංගම් මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය. |
| • බෝගහකුඹුර ප්‍රාදේශීය රෝහලේ ප්‍රධාන ගේට්ටුව අසලට | ස්ථානභාර වෛද්‍ය නිලධාරීතුමා | |
| • ඔහිය ගමේ ස්ථාන තුනක් සඳහා | ගරු මන්ත්‍රීනී ඩබ්.ඩබ්.නිමළි නිරංජලා මහත්මිය | |
| • පඳිනාවෙල මුස්ලිම් පල්ලිය අසල<br>• බෙක්කේඅරාව පල්ලිය අසල<br>• බෙරගස් නගරයේ පල්ලිය අසල | ගරු මන්ත්‍රී ඒ.සී.ඒමුත්තලිෆ් මහතා | |
| • යල්පත්වෙල හන්දියට<br>• නාවෙලචන්දමඩුව මාර්ගයේ හන්දියට<br>• මැදගෙදරගම වසමේ දඹවින්න හන්දියට | | |

13. දෛනික වැටුප හාපෙර පාසලේ ඉදිරි වැඩ කටයුතු භාර ගැනීම සඳහා ඉල්ලීමක් කිරීම සම්බන්ධව සහය පාලිකා ආර්.එම්.නිලුක්ෂි මනුල්යාමිය ඉදිරිපත්කර ඇති ලිපිය

යල්පත්වෙල ප්‍රදීප පෙර පාසලේ මෙතෙක් ප්‍රධාන ගුරුතුමිය ලෙස සේවය කල මධුශානි ගුරුතුමිය 2023.01.02 සිට බෝගහකුඹුර නව පෙර පාසල වෙත මාරු කර යවා ඇති බැවින් පෙර පාසලේ ඉදිරි කටයුතු කරගෙන යාමට අවසර ඉල්ලමින් හා මෙතෙක් දෙමාපියන් විසින් රු.350.00 ක් බැගින් ලබාදෙන මාසික දීමනාවක් ලබාගත් බැවින්, දෛනික දීමනාව ලබාදෙන ලෙස ඉල්ලමින් යල්පත්වෙල ප්‍රදීප පෙර පාසලේ සහය පාලිකා ආර්.එම්.නිලුක්ෂි මනුල්යාමිය ඉදිරිපත්කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.
ඒ අනුව යල්පත්වෙල ප්‍රදීප පෙර පාසලේ කටයුතු සිදු කිරීමට සහය පාලිකා ආර්.එම්.නිලුක්ෂි මනුල්යාමිය හට අවසර ලබාදීමටත්, දින 180 ක් සේවය කිරීමෙන් පසු දෛනික දීමනාවක් ලබාදීම සඳහා ඉදිරි කටයුතු සිදු කිරීමටත් මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී වජිර දෙනගම මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

14. මළාපවහන ගිවිසුම අනුමත කර ගැනීම සම්බන්ධව ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

මළාපවහන සේවා සම්බන්දතාවය ලබාගැනීම හා ගාස්තු අය කිරීම වෙනුවෙන් සකස් කරන ලද මළාපවහන ගිවිසුම ගරු සභාපතිතුමා විසින් මුදල් කමිටුවට ඉදිරිපත්කර ඇති අතර, එය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.
එහිදී අපජල සම්බන්ධතාවයක් ලබාගැනීම සඳහා වූ ගිවිසුම් පත්‍රය පරීක්ෂා කල මුදල් කමිටුව ගිවිසුම නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී නාලක ප්‍රියන්ත මහතා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

15. ජේ.සී.බී.යන්ත්‍රය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිප

ජේ.සී.බී.යන්ත්‍රය පහත සඳහන් කාර්යයන් ඉටු කර ගැනීම සඳහා ලබාදෙන ලෙස ඉල්ලමින් ඉදිරිපත් කර ඇති ලිපි මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.

| ජේ.සී.බී.යන්ත්‍රය අවශ්‍ය කාරණය | ඉල්ලා ඇති අය | නිර්දේශය |
|---|---|---|
| අඹේවෙල ශ්‍රී මුත්තුමාරියම්මන් දේවාලය අලුත්වැඩියා කිරීම සඳහා ගෙපලක් සකසීම | ශ්‍රී මුත්තුමාරියම්මන් දේවාලයේ පූජකතුමා | |
| වියලකුඹුර සුසාන භූමිය මාර්ගය සංවර්ධනය කර කොන්ක්‍රීට් ඇතිරීම | වියලකුඹුර,බටපොළ, මඩුල්අරාව, දික්රෙද එක්සත් තරුණ සුභ සාධක සමිතිය | |
| බෙරලන්ද හවරියමල්වෙල බුදුමැදුර අබියස සිට මැදහෙල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බැකෝ යන්ත්‍රය යෙදවීම | ග්‍රාමීය ප්‍රජා සංවර්ධන සමිතිය, හවරියමල්වෙල | . |
| යල්පත්වෙල නාස අරාව මාර්ගය සංවර්ධනය කිරීම සඳහා බැකෝ යන්ත්‍රය යෙදවීම | ග්‍රාම සංවර්ධන සමිතිය, යල්පත්වෙල | |

| | | |
|---|---|---|
| උඩුකිරින්ද සිට කෙළතැන්න දක්වා වන මාර්ගයට අඹේවෙල ව්‍යාපාරයේ ඇල කැඩීමෙන් මාර්ගය අබලන් වී ඇති බැවින් එය බැකෝ යන්ත්‍රය යොදා සකස් කිරීම | වීරෙන්ධර ප්‍රජාමූල ප්‍රධාන ශාඛා සංවිධානය, ඌව අඹේවෙල | ප්‍රාදේශීය සභාව සතු ජේ.සී.බී. යන්ත්‍රය අදාළ කාර්යයන් ඉටු කර ගැනීමට කාර්මික නිලධාරී ඇස්තමේන්තුවක් රැගෙන ලබා දීමටත්, ඒ සඳහා වැය වන ඉන්ධන අදාළ සමිතිය හෝ පුද්ගලයාගෙන් අය කිරීමටත් මුදල් කමිටුව නිර්දේශ කරන ලදී ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර එහිදී ගරු මන්ත්‍රී ඉන්දික සම්පත් මැතිතුමා පවසා සිටියේ සමිති මගින් ඉදිරිපත් කරණු ලබූ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක නොකරන ලෙසත්, මේ අතරින් ගරු මන්ත්‍රී මණ්ඩලය මගින් ඉදිරිපත් කරණු ලබූ යෝජනා පමණක් ක්‍රියාත්මක කරන ලෙසත්ය. ඒ අනුව මේ අතරින් ගරු මන්ත්‍රීනී මන්ද්‍රිකා තෙන්නකෝන් මැතිනිය විසින් ඉදිරිපත් කරන ලද වංගියගෙඩ සොහොන් භූමිය බැකෝ යන්ත්‍රය යොදා මට්ටම් කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාව පමණක් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.ඒ අනුව එම තීරණය ඇතුලත් යෝජනාව නාලක ප්‍රියන්ත මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව සංශෝධනයන්ට යටත්ව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය. |
| වියලකුඹුර සුසාන භූමිය මාර්ගය සංවර්ධනය කර කොන්ක්‍රීට් ඇතිරීම | වියලකුඹුර,බටපළ, මඩුල්අරාව,දික්රෙද එක්සත් තරුණ සුභ සාධක සමිතිය | |
| වංගියගෙඩ සොහොන් භූමිය බැකෝයන්ත්‍රය යොදාමට්ටම් කිරීම | ගරු මන්ත්‍රී මන්ද්‍රිකා තෙන්නකෝන් මැතිනිය | |

16. සංවර්ධන යෝජනා

පහත සඳහන් සංවර්ධන යෝජනාමුදල් කමිටුව සාකච්ඡාකරන ලදි.

| සංවර්ධන යෝජනාව | ඉදිරිපත් කල අය | මුදල් කමිටු නිර්දේශය |
|---|---|---|
| ඔසුවගාව හා ආහාර විජලනය සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා ගැනීම | අඹගහකුඹුර රන්තරු ප්‍රජා මණ්ඩලය | මෙම සංවර්ධන යෝජනා මහ සභාවේ අනුමතියට යොමු කර, අනුමතිය ලද පසු පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමතියට යොමු කර ඉදිරි කටයුතු සිදු කිරිමට නිර්දේශ කරන ලදී. |
| වැලිමඩ පොලීසිය අසල ජාත්‍යන්තර පාසල අසලින් ඇල්ල විහාරස්ථානය දක්වා ඇති මාර්ගය කොන්ක්‍රීට් කිරිම සඳහා සිමෙන්ති,වැලි, ගල් ලබා ගැනීම | ඇල්ල, ඌරම්මලතැන්න එක්සත් සුභසාධක සමිතිය | |
| ගුරුතලාව ක්‍රීඩා පිටියේ ක්‍රීඩා මණ්ඩපය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අඩි 10 ඇස්බැස්ටෝස් තහඩු 06 ක් ලබා ගැනීම | ගුරුතලාව ස්පෝර්ට් ක්ලබ් | |
| යල්පත්වෙල සිට දඹවින්න අම්බලම දක්වා ඇති කෘෂි මාර්ගයට බොක්කු බට දැමීම | මැදගෙදරගම සුහද ගොවි සංවිධානය | |
| මල්ටිමීඩියා ප්‍රොජෙක්ටර් යන්ත්‍රයක් ලබා ගැනීම | රේන්දපොල ශ්‍රී ගණපති හින්දු විදුහලේ විදුහල්පතිතුමා | |
| ඩයරබා වත්තේ උඩ කොටසේ ක්ෂේත්‍ර අංක 06 හි ඩයරබා දෙමළ විද්‍යාලය අසල ජල | ගරු මන්ත්‍රී වී.රාසලිංගම් මැතිතුමා ඉදිරිපත් කරඇති ලිපිය | |

| | |
|---|---|
| ටැංකිය අසල මාර්ගයේ බෝක්කු බට දැමීම | |
| ඕලුගංතොට මැදගෙදර මාර්ගයට කොන්ක්‍රීට් බොක්කු බට 07ක් ලබා ගැනීම | සමගි ග්‍රාම සංවර්ධන සමිතිය, ඕලුගංතොට |

17. ජලනල උපාංග ලබාගැනීම සම්බන්ධව තණ්නෙකුඹුර උප කාර්යාලයේ කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

තණ්නෙකුඹුර නව පෙර පාසලේ ළමුන්ගේ අත් සේදීම සඳහා සින්ක් එකක් සවි කිරීමට අවශ්‍ය ජල නල මාර්ගය සකස් කර ගැනීම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ගබඩාවෙන් ලබාදෙන ලෙස ඉල්ලමින් කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.

I. අඟල් ½ පී.වී.සී.බට - 05
II. අඟල් ½ වල්- 01
III. අඟල් ½ සොකට් - 07
IV. අඟල් ½ එල්බෝ- 03
V. අඟල් ½ ටී - 01
VI. ඇක්සෝ බ්ලේඩ් - 01
VII. එස්ලෝන් පෙඩ් ගම් - 01
VIII. අඟල් ½ වල් සොකට් - 02

ඉහත සඳහන් ද්‍රව්‍ය තණ්නෙකුඹුර උප කාර්යාලයේ කාර්ය භාර නිලධාරී වෙත ගබඩාවෙන් ලබාදීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ගාමිණී ජයන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

18. සුසාන භූමිය මැනීම් සිදු කර මායිම් ලකුණු කර ගැනීම සඳහා නදුන්ගමුව ප්‍රගතිශීලී සහනාධාර සමිතිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

නදුන්ගමුව ගම් කොටසට අයත් සුසාන භූමිය මැනීම් සිදුකර මායිම් ලකුණු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා ප්‍රගතිශීලී සහනාධාර සමිතිය විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.
මෙම සුසාන භූමිය මැනීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා වලිමඩ ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ලිපි යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී මුත්තලිප් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

19. බදු පදනම මත කඩ කාමරයක් ලබාගැනීම සඳහා වලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

වලිමඩ පොළ භූමියේ අංක 22 කඩ කාමරය බදු පදනම මත වසර 15 ක කාලයක් සමිතියට ලබාදී ඇති අතර, රු.118900.00 ක මුදලක් සභාව වෙත ගෙවූ බවත්, නමුත් එය ව්‍යාපාරික කටයුතු සඳහා ප්‍රමාණවත් නොවූ බැවින් කඩ කාමරයක් ඉල්ලීම් කලද කඩ කාමරයක් නොළද හෙයින් ඩයරබා දඹවින්න උපකාර්යාලයට අයත් කඩ කාමරයක් සමිතියට ලබාදෙන ලෙසත්, ඒ සඳහා වන තක්සේරු මුදල් සමිතිය විසින් ගෙවීමට එකඟ වන බවත් සඳහන් කරමින් වලිමඩ විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.
සභාව මගින් වලිමඩ පොළ භූමියේ අංක 22 කඩ කාමරය ලබාගෙන වසර ගණනක් ගත වී ඇති බැවින්, ඒ පිළිබඳව කටයුතු කිරීමට සභාවට නොහැකි බව දන්වා සමුපකාර සමිතිය වෙත ලිපියක් යොමු කිරීමටත්, ඉදිරියේදී ඩයරබා වෙළද සංකීර්ණය ටෙන්ඩර් කර ලබා දීමේදී ඉල්ලුම් කරන ලෙස දැන්වීමටත් මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී නාලක ප්‍රියන්ත මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

20. 2022.12..31 දිනට අදාළ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිළධාරීන් පත්කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මන්ඩලය පත් කළ යුතුව ඇති බැවින් ඒ අනුව වලිමඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය,කැප්පෙටිපොළ උප කාර්යාලය ,බොරලන්ද උප කාර්යාලය හා තණ්නේකුඹුර උප කාර්යාලය, දඹවින්න උප කාර්යාලය හා කෙළිපොෂ්ට් අංගනය හා ආදාහනාගාරය භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පහත පරිදි පත් කිරීම සුදුසු බව යෝජනා කරමින් ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.

වලිමඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලය හා පොළ භූමිය (දින 03ක් රාජකාරී ඉටු කිරීම)

සභාපති - විමර්ශන නිලධාරී - D.M.W.J දිසානායක මයා
සමාජික - ප්‍රජාසංවර්ධන නිලධාරී - රුමේෂ් ප්‍රියන්ත මයා
සමාජික - සංවර්ධන නිලධාරී - කසුන් සඳරුවන් මයා
සමාජික - කළමනාකරණ සේවා නිළධාරී - R.M.C රත්නායක මිය
සමාජික- කළමනාකරණ සේවා නිළධාරිණී -. W.M සුනාන්දා වීජේසේකර මිය

කැප්පෙටිපොළ උප කාර්යාලය (දින 02 ක් රාජකාරී ඉටු කිරීම)
සභාපති - විමර්ශන නිලධාරී - D.M.W.J දිසානායක මයා
සමාජික - ප්‍රජාසංවර්ධන නිලධාරී - රුමේෂ් ප්‍රියන්ත මයා
සමාජික - කළමනාකරණ සේවා නිළධාරී - K.A විනීතා මිය
සමාජික- කළමනාකරණ සේවා නිළධාරී - V. S.L.S - වීරසිංහ මිය
බොරලන්ද කාර්යාලය (දින 01 ක් රාජකාරී ඉටු කිරීම)
සභාපති - විමර්ශන නිලධාරී - D.M.W.J දිසානායක මයා

සමාජික - සංවර්ධන නිලධාරි - කසුන් සදරුවන් මයා
සමාජික - කළමනාකරණ සේවා නිලධාරි - එන්.එම්.නිලූකා ගීතාංජලී මිය
සමාජික - කළමනාකරණ සේවා නිලධාරි - ඒ.එම්.ශානිලී උදයංගනී මිය

දඹවින්න උප කාර්යාලය (දින 01 ක් රාජකාරි ඉටු කිරීම)
සභාපති - විමර්ශන නිලධාරි -ඩී.එම්.එම.ඩබ්.ජේ දිසානායක මයා
සමාජික - සංවර්ධන නිලධාරි - කසුන් සදරුවන් මයා
සමාජික - සංවර්ධන නිලධාරි - දෙණදි පිරිස් මිය
සමාජික - සංවර්ධන නිලධාරි - R.M. රිෂාඩ් මයා
සමාජික - කළමනාකරණ සේවා නිලධාරි -M.G නදීකා දිල්රුක්ෂි මිය
**තන්නේකුඹුර උප කාර්යාලය** (දින 01 ක් රාජකාරි ඉටු කිරීම)

සභාපති - විමර්ශන නිලධාරි -ඩී.එම්.ඩබ්.ජේ දිසානායක මයා
සමාජික - ප්‍රජාසංවර්ධන නිලධාරි - රුමේෂ් ප්‍රියන්ත මයා
සමාජික - කළමනාකරණ සේවා නිලධාරි -M.G නදීකා දිල්රුක්ෂි මිය
සමාජික - කළමනාකරණ සේවා නිලධාරි - E.G අමලි කරුණාරත්න මිය
සමාජික - කළමනාකරණ සේවා නිලධාරි - K.A විනීතා මිය
**ආදාහනාගාරය කොම්පෝස්ට් අංශය** (දින 01 ක් රාජකාරි ඉටු කිරීම)

සභාපති - විමර්ශන නිලධාරි -ඩී.එම්.ඩබ්.ජේ දිසානායක මයා
සමාජික - ප්‍රජාසංවර්ධන නිලධාරි - රුමේෂ් ප්‍රියන්ත මයා
සමාජික - සංවර්ධන නිලධාරි - කසුන් සදරුවන් මයා
සමාජික - කළමනාකරණ සේවා නිලධාරි - A.M.S. කුමාරිහාමි මිය
සමාජික - කළමනාකරණ සේවා නිලධාරි - H.M.B සුමනවතී මිය

මීට අමතරව ප්‍රධාන කාර්යාලයට හා උප කාර්යාල හතරට භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල සමාජිකයන් පත් කර ගන්නා ලෙස සඳහන් කරමින් ගරු සභාපතිතුමා ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.
ඒ අනුව 2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත නම් සඳහන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී වසන්ත නානායක්කාර මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

21. ගුරුතලාව හපුරෙද ඉඩමේ ගොඩනැගිල්ල සම්බන්ධව අයි.එස්.අබ්දුල් සලාම් මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

අයි.එස්.අබ්දුල් සලාම් මහතා විසින් ගුරුතලාව හපුරෙද ඉඩම ගොඩනැගිල්ල සඳහා පවරා ලියාපදිංචි කර ඇති අතර, එම ගොඩනැගිල්ල ගරු සභාපතිතුමාගේ උපදෙස් ලැබීමෙන් අනතුරුව සභාවට පවරා දීමට එකඟ වන බව පවසමින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.
මෙය මහ සභාවේ අනුමතියට යොමු කර සාකච්ඡා කිරීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කිරීම සුදුසු බව මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ඉල්ලියාස් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

22. වෙළඳ කුටිය වෙනත් ස්ථානයක තබා ගැනීම සම්බන්ධව සන්ධ්‍යා දමයන්ති මිය ඉදිරිපත් කර ඇති ලිපිය

කප්පෙටිපොළ පොළ ගේට්ටුව අසල වෙළදාම සිදු කර ගත් වෙළඳ කුටිය ප්‍රාදේශීය සභාවෙන් දැනුම් දුන් පරිදි ඉවත් කර ගත් අතර, එයින් තමා බෙහෙවින් ආර්ථික අපහසුතාවයට පත්ව ඇති බැවින් මෙම වෙළඳ කුටිය වෙනත් සුදුසු ස්ථානයක තබා ගැනීමට අවසර ලබා දෙන ලෙස ඉල්ලමින් සන්ධ්‍යා දමයන්ති මිය ඉදිරිපත් කල ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.
ආදායම් පරීක්ෂක නිලධාරි විසින්ද කරත්තය තබා ගැනීම සඳහා සුදුසු ස්ථානයක් හඳුනා ගැනීමට නොහැකි වූ බවත්, ඉදිරියේදී පරීක්ෂා කර සුදුසු ස්ථානයක් ඇත්නම් දැනුම් දීමට කටයුතු කර බව දන්වමින් වාර්තා කර ඇති බැවින් , දැනට කරත්තය තබා ගැනීමට ස්ථානයක් ලබා දීමට නොහැකි බව සන්ධ්‍යා දමයන්ති මිය හට දැන්වීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී රාසලිංගම් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

23. දිවාසුරැකුම් මධ්‍යස්ථානය සඳහා පළිකාවක් පත් කර කරවන මෙන් ඉල්ලා කප්පෙටිපොළ උප කාර්යාලයේ කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

කප්පෙටිපොළ උප කාර්යාලය මගින් පාලනය වන දිවාසුරැකුම් මධ්‍යස්ථානයේ සේවය කරන ලද අශෝකා කුමාරි මහත්මිය වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත විශ්‍රාම ගොස් ඇති බැවින් මේ වන විට බහුකාර්ය සංවර්ධන සහයක අය දෙදෙනෙකු යොදවා ක්‍රියාත්මක කරනු ලබන බැවින් දිවාසුරැකුම් මධ්‍යස්ථාන පළිකාවක් ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලදී.
මේ සඳහා දිවාසුරැකුම් මධ්‍යස්ථානයේ මීට පෙර සේවය කල අශෝකා කුමාරි මහත්මියට ගෙවීම් කරන ලද්දේ 2022.05.23 දිනැති සභා තීරණයෙන් බැවින්, එම සභා තීරණය පරිදි ගෙවීම් කර, දිවාසුරැකුම් මධ්‍යස්ථාන පළිකාවක් සේවයේ යොදවා ගැනීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී රවීන්ද්‍ර ප්‍රභාත් මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

24. ජලනල උපාංග ලබා ගැනීම සම්බන්ධව කප්පෙටිපොළ උප කාර්යාලයේ කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

කප්පෙටිපොළ උප කාර්යාලයේ ඇති ජලනල හා උපාංග ගබඩාවට පහත සඳහන් ද්‍රව්‍ය ලබා දෙන ලෙස ඉල්ලමින් කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡා කරන ලද අතර, ඒ සඳහා පහත සඳහන් ද්‍රව්‍ය මිල ගණන් කැඳවා ලබා ගැනීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහා මහ සභා අනුමතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී. ජයතිලක මන්ත්‍රීතුමා විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

I. PVC බට 32mm -30
II. PVC බට 25mm-15
III. PVC end cap 20mm - 50

25. ළමාපුටු 10ක් හාපෙර පාසල් සහයිකාවක් ඉල්ලීම සම්බන්ධව තණ්නෙකුඹුර කාර්ය භාර නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ලිපිය

තණ්නෙකුඹුර නව පෙර පාසල සඳහාළමුන් 35 දෙනෙක් අතුලත් වී ඇති අතර, තවත් සිසුන් 10 දෙනෙකු පමණ ඇතුලත්වීමට ඇති බැවින් දැනට පවතින ළමාපුටු 30 ප්‍රමාණවත් නොවන බැවින් ළමාපුටු 10ක් ලබාදෙන ලෙසත්, පුහුණුවන ගුරුවරියක් සේවයේ නියුතු වුවත් ළමුන් අධික බැවින් අමතර සහයිකාවක්ද ලබා දෙන ලෙස ඉල්ලමින් තණ්නෙකුඹුර ප්‍රගති පෙර පාසලේ ගුරුතුමිය විසින් ඉදිරිපත්කර ඇති ලිපිය කාර්යභාර නිලධාරී විසින් නිර්දේශ කර මුදල් කමිටුවට ඉදිරිපත් කර ඇත.

ඒ අනුව පෙර පාසල සඳහාළමාපුටු ලබාගත් ආයතනයෙන්ම තවත් ළමාපුටු 10ක් ලබාගැනීමටත්, සේවයට බඳවාගැනීම් මේ වන විට නවතාඇති අතර පෙර පාසල් සහයිකාවක් බඳවාගැනීම සිදු කල නොහැකි බැවින්, ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ඩී.පී.ජයතිලක මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

26. බස් නැවතුම්පලක් සවි කර ගැනීම ගැනීමට අවසර ලබාගැනීම සම්බන්ධව ගරු මන්ත්‍රී වී.රාසලිංගම් මැතිතුමාඉදිරිපත් කරඇති ලිපිය

ඩයරබාවතු යාය ඉහල කොටසේ 3සී ක්ෂේත්‍රය අසල බස් නැවතුම්පලක් සවි කර ගැනීම සඳහාඅනුමතිය ලබාගැනීම සඳහාඩයරබාවතු යායේ කළමනාකරුතුමා වෙත යොමු කල ලිපිය, මල්වතු වැවිලි සමාගමේ විධායක අධ්‍යක්ෂතුමා වෙත යොමු කර ඇත. එතුමා විසින් බස්නැවතුම්පල 6*10 ප්‍රමාණයෙන් සෑදීමට ඉඩ ලබාදිය හැකි බවත් ඒ සඳහාගරු සභාපතිතුමාගේ අත්සන සහිත ලිපියක් මල්වතු වැවිලි සමාගමේ අධ්‍යක්ෂතුමාවෙත යැවීමට ලබාදෙන ලෙස ඉල්ලමින් ගරු මන්ත්‍රී වී.රාසලිංගම් මැතිතුමාඉදිරිපත් කර ඇති ලිපිය මුදල් කමිටුව සාකච්ඡාකරන ලදී.

ඒ අනුව බස් නැවතුම්පල සවි කිරීම සම්බන්ධව විස්තර දන්වමින් මල්වතු වැවිලි සමාගමේ අධ්‍යක්ෂතුමාවෙත ලිපියක් යොමු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී. ඒ අනුව එම නිර්දේශ සඳහාමහ සභාඅනුමැතිය ලබාගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමාවිසින් සභාවට යෝජනාකරන ලද අතර ගරු මන්ත්‍රී මහේන්ද්‍ර කුමාර් මැතිතුමාවිසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ගරු සභාපතිතුමාගේ මෙම යෝජනාව 2023.01.23 දිනැති මහ සභාවේදී ඒකමතිකව සභාසම්මත විය.

